# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2460/36 - 2025 ඔක්තෝබර් මස 31 වැනි සිකුරාදා - 2025.10.31**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

අධිකරණ සේවා කොමිෂන් සභා රීති සංශෝධනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1978 දෙසැම්බර් මස 08 වැනි දිනැති අංක 14 දරන *ගැසට් පත්‍රයේ* ආණ්ඩුවේ නිවේදන යටතේ පළ කර ඇති අධිකරණ සේවා කොමිෂන් සභා රීති වලට අදාළ II වන කොටසේ ඇති ''අධිකරණ නිලධරයන්ගේ පත්වීම්, උසස්වීම් සහ මාරුවීම්'' යටතේ 06 වන ඡේදයේ සඳහන් කර ඇති සුදුසුකම් ඉවත් කොට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2023 අප්‍රේල් මස 04 වැනි දිනැති අංක 2326/31 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* රජයේ නිවේදන යටතේ පළ කරන ලද සුදුසුකම්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි ඉවත් කර, ඒ වෙනුවට පහත සුදුසුකම් අදාළ විය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

**ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II පන්තියේ I ශ්‍රේණිය (මහේස්ත්‍රාත්) තනතුර:**

*සුදුසුකම්* :-

අ. අවුරුදු තුනකට නොඅඩු කාලයක් ක්‍රියාකාරී වෘත්තියෙහි යෙදී සිටින හෝ යෙදී සිටි නීතිඥවරයෙකු වීම,

හෝ

ආ. නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දී වසර තුනකට නොඅඩු සේවා කාලයක් ඇති ශ්‍රේෂ්ඨාධිකරණයේ/ අභියාචනාධිකරණයේ නීති පර්යේෂණ නිලධරයකු ලෙස සේවය කර ඇති නීතිඥවරයකු වීම,

හෝ

ඇ. යම් අමාත්‍යාංශයක, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් රජයේ ආයතනයක අවුරුදු තුනකට නොඅඩු කාලයක් නීති නිලධරයකු ලෙස සේවය කර ඇති සහ එම කාලය තුළ නිරතුරුවම අධිකරණය ඉදිරියේ පෙනී සිටි නීතිඥවරයකු වීම,

හෝ


1A - PG 7321 — 04 (2025/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඈ. යම් සමාගමක හෝ බැංකුවක හෝ ආයතනයක නීති නිලධරයකු ලෙස අවුරුදු තුනකට නොඅඩු කාලයක් සේවය කර ඇති සහ එම කාලය තුළ නිරතුරුවම අධිකරණය ඉදිරියේ පෙනී සිටි නීතිඥවරයකු වීම,

*සැ.යු.* : ඉහත (අ.), (ආ.), (ඇ.) සහ (ඈ.) යන ඡේදයන් හි සඳහන් කර ඇති ''අවුරුදු තුනකට නොඅඩු'' සේවා කාලය/ ක්‍රියාකාරී වෘත්තීය කාලය ගණනය කිරීමේදී, ඉහත (අ.), (ආ.), (ඇ.) සහ (ඈ.) හි සඳහන් සේවා කාලයන්/ ක්‍රියාකාරී වෘත්තීය කාලයන් හි සංකලනයන් ද සලකා බැලේ.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

**ප්‍රසන්න අල්විස්,**
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2025 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

EOG 10 - 0294

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.